සංවේදි ප්‍රවාහන පද්ධති ව්‍යාපෘතිය - 2014

-----------------------------------------------

සංවේදි ප්‍රවාහන පද්ධති ව්‍යාපෘතියේ 2013 නොවැම්බර් 29 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රථම ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2013 මාර්තු 18 දින එළඹි අංක 1260740 දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සම්පාදනය සහ කාලපරිච්ඡේදය

--------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, මහා මාර්ග හා ආයෝජන සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ගවල සංවේදී ප්‍රවාහන පද්ධති සංවර්ධනය සඳහා පසුකාලීන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය වූ ජපාන යෙන් මිලියන 940 කට සමාන රු.මිලියන 1,316 ක මුදල ලබාදීමට ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතියෙහි කටයුතු 2013 නොවැම්බර් 29 දින ආරම්භ කළ අතර 2015 ජූලි 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව, උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තකිසේරු කිරීමට අවශ්‍ය යැයි සලකනු ලබන පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘතිය කළමනාකරණයෙහිලා සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියෙහි මෙහෙයුම් වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ව්‍යාපෘතියෙහි වියදම් ව්‍යාපෘතිය මගින් නඩත්තු කර තිබුණු වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සැසදීම් කර තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ප්‍රදානයන් කරන ලද නියෝජිත ආයතනයෙන් ලැබුණු අරමුදල් වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් වූ වියදම්, මූල්‍ය සහ භෞතික වශයෙන් වැඩසටහනෙහි ප්‍රගතිය, වැඩසටහනෙහි මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වීම පිණිස අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබුවේද යන බව,

(ඈ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියෙහි අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඊ) මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙලකර තිබුණේද යන බව, සහ

(උ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වෙන කරුනුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැරුණුවිට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇතිබව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මුදල් ප්‍රකාශ සමඟ අනුකූලතා ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත වෙන්කිරීම් සහ 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය කිරීමට අදාල ඇතැම් වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් වෙන් කළ මුදල | 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| නියෝජිතායතනය | 940 | 1,316 | 1,173.52 | 583.19 | 746.06 |
| ශ්‍රී.ලං.ර. | - | - | 11.70 | - | 51.76 |
| | 940 | 1,316 | 1,185.22 | 583.19 | 797.82 |

3.2 භෞතික කාර්යසාධනය

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග සඳහා සංවේදී ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීමට හා වැඩිදියුණු කිරීමට දායකත්වය ලබාදීමයි. වෙනස් වන සුළු සංඥා පුවරු සඳහා යකඩ ආකෘති සැලසුම් කිරීම හා ඉදිකිරීම සහ රථ වාහන කවුළු ඇතුළත් උපකරණ සපයා සවි කිරීමත්, සේවා ප්‍රදේශය තුළ වර්ෂා මාපක සවි කිරීම රථ වාහන පිළිබඳ තොරතුරු පුවරු සවි කිරීම සඳහා පරිගණක මෘදුකාංග ප්‍රවර්ධනය කිරීම, අත් විවර සවි කිරීම, කේබල් ඇතිරීම, වැඩ බිම් පරික්ෂාව හා පුහුණු කිරීම් යනාදී කටයුතු මීට ඇතුළත් වේ.

2015 ජුනි 23 දින වැඩබිමෙහි සිදුකරන ලද වාරක පරීක්ෂාවේදී සියලුම සවි කිරීම් කටයුතු අවසන් කර පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර තිබුණු බව නිරීක්ෂණය විය. මෙහි වැඩබිම් පරීක්ෂා කිරීම 2015 ජුලි 09 දින අවසන් කර තිබුණි.